එන්-40

# ප්‍රසම්පාදන දැන්වීමයි

## රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

**කොන්ත්‍රාත් අංකය - DGP/OS/04/Clean.s/2024-2025**

# පවිත්‍රතා සේවාව ලබාගැනීම

කොළඹ 08, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ යෝජිත ස්ථානයට අදාළ පවිත්‍රතා සේවාවන් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අවශ්‍යතා සපුරාලන පිළිගත් සැපයුම්කරුවන්ගෙන් පමණක් එක් වර්ෂයක කාලයකට (2024/2025) ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ ලංසු කැඳවනු ලැබේ.

**මේ සඳහා සපුරාලිය යුතු මූලික සුදුසුකම් පහත පරිදි වේ.**

1. ව්‍යාපාරයේ නම ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඉහත සේවාව සඳහා ලියාපදිංචි වී තිබීම.
2. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පිළිගත් ආයතනවලට පවිත්‍රතා සේවා සැපයීම පිළිබඳව අවම වශයෙන් පූර්වාසන්න වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, දැනටමත් එවැනි ආයතනයන්ට සේවා සපයන ආයතනයක් විය යුතුය.

   (**සැ.යු.** - ඉල්ලුම් පත්‍රය සමග ඉහත අංක 1,2 සුදුසුකම් දක්වෙන අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවිය යුතුයි)
3. ලංසු ලේඛන ලබාගැනීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ රජයේ මුද්‍රණාලයාධිපති නමින් ලිඛිත ඉල්ලීමක් කළ යුතුය. එකී ඉල්ලීමෙන් පසු ආපසු නොගෙවනු ලබන රු. 2,500.00 ක මුදලක් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා ලබාගන්නා වූ රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පසු 2024.04.03 දින සිට 2024.04.24 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත ලිපිනයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වෙනත් සැපයීම් අංශයෙන් ලංසු ලියවිලි ලබාගත හැකි අතර, මෙම ලංසු ලියවිලි ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂාකර බැලිය හැකිය.
4. ලංසුකරු ස්වකීය ලංසුව සමග, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, "**රජයේ මුද්‍රණාලයාධිපති**" නමින්, රු.100,000.00 ක ලංසු ඇපකරයක්/ බැංකු ඇපකරයක් හෝ එකී වටිනාකම, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයේ සරප් කවුන්ටරය වෙත ගෙවීම කර ලබාගත් රිසිට් පත ඉදිරිපත් කළ යුතු වේ.
5. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි ඇතුළත් අයදුම්පත් කවරයක බහා 2024.04.25 දින ප.ව. 02.00 ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් සැපයීම් අංශයේ තබා ඇති ප්‍රසම්පාදන පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. ඔබගේ ලංසු ඉදිරිපත් කරන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ පවිත්‍රතා සේවාවන් සඳහා ලංසු 2024/2025**" යනුවෙන් සඳහන් කළ යුතුය. 2024.04.25 දින ප.ව. 02.00 ට ලංසු භාර ගැනීම අවසන් වන අතර, ඒ විගසම ලංසු විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාව සඳහා ඔබට හෝ ඔබේ නියෝජිතයෙකුට සහභාගී විය හැක.
6. පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2024.04.18 දින පෙ.ව. 10.00 ට දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පවත්වනු ලැබේ.
7. වැඩි විස්තර, සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 3.30 දක්වා පහත ලිපිනය සඳහන් කාර්යාලයේ වෙනත් සැපයීම් අංශයෙන් ලබාගත හැක.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.**

2024.04.03

**දුරකථන** : 011 2673311 /ෆැක්ස් :011 2698653
**වෙබ් අඩවිය** : www.documents.gov.lk
**විද්‍යුත් තැපෑල** : othersupplydgp@gmail.com